සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# භූගෝල විද්‍යාව

**6 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 ශ්‍රී ලංකාවේ උතුරු පළාත දිස්ත්‍රික්ක ...................................... කින් සමන්විත ය. (3 / 5 / 4)

02 වායුගෝලයේ පවත්නා වායු වර්ග අතරින් ශාක වර්ධනයට වඩාත් වැදගත් වන්නේ ...................................... වායුවයි. (ඔක්සිජන් / නයිට්‍රජන් / හයිඩ්‍රජන්)

03 ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂීන් අතර ...................................................................... එක් පක්ෂියෙකි. (වවුලා / ගිරවා / අවිච්චියා)

04 ශ්‍රී ලංකාවේ තැනිතලා ප්‍රදේශවල ............................................................ වගාව සිදුකරයි. (තේ / පොල් / රබර්)

05 ගෘහ ආශ්‍රිතව සිදුකරන ...................................... කර්මාන්ත ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම දක්නට ලැබේ. (මහා පරිමාණ / කුඩා පරිමාණ / මධ්‍යම පරිමාණ)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 ප්‍රවාහනයේ දී වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම රජය නොමිලේ ලබාදෙන සේවයකි. ( )

07 චිත්‍රයකට වඩා සිතියමකින් භූගෝලීය ලක්ෂණවල පිහිටීම හා දුර ප්‍රමාණය නිශ්චිතව දැක්විය හැකිය. ( )

08 ඝනීභවනය වූ ජලවාෂ්ප වර්ෂණය මගින් පොළවට පතිත වේ. ( )

09 කාලගුණික තොරතුරු දැනගැනීම වඩාත් වැදගත් වන්නේ පාසල් සිසුන්ටයි. ( )

10 බස්නාහිර හා උතුරු දිශාව අතර ඊසාන දිශාව පිහිටා ඇත. ( )



LIVEWORKSHEETS

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ශ්‍රී ලංකාවේ පළාත් අතරින් වෙරළ තීරයන් හිමි නොවන පළාත මින් කුමක් ද?

(1) උතුරු පළාත (2) වයඹ පළාත (3) සබරගමුව පළාත (4) බස්නාහිර පළාත

12 ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට අයත් ස්වභාවික වරාය මින් කුමක් ද?

(1) හම්බන්තොට (2) ත්‍රිකුණාමලය (3) ගාල්ල (4) කොළඹ

13 ශාකවලින් පරිසරයට ලැබෙන ප්‍රයෝජනය කුමක්දැයි තෝරන්න.

(1) ඉන්දන ලබාදීම (2) ආහාර හා ඖෂධ ලබාදීම

(3) වායුගෝලය පිරිසිදු කිරීම (4) ගෘහ භාණ්ඩ නිර්මාණයට දැව සැපයීම

14 පාසලක අනන්‍යතාවය දැක්විමට මෙය අත්‍යවශ්‍ය නොවේ

(1) පාසලේ නම (2) පාසල අයත් ඡන්ද කොට්ඨාසය

(3) අධ්‍යාපන කලාපය (4) අධ්‍යාපන කොට්ඨාසය

15 සිතියමක දක්නට නොලැබෙන ලක්ෂණයකි

(1) ත්‍රිමාණ ස්වරූපයක් ගැනීම (2) වර්ණවත් වීම

(3) පැතලි ස්වභාවය (4) දිශාව දැක්වීම

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16 දරුවා වැඩෙත්ම අධ්‍යාපනය ලබාදෙන විධිමත් ආයතනය වන්නේ ............................................ යි.

17 ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ ............................................ පිහිටා ඇත.

18 වළාකුළු නොමැති අහස ............................................ වර්ණයෙන් දිස්වේ.

19 අපට උෂ්ණත්වය හා තාපය ලබාදෙන්නේ ............................................ යි.

20 මහාමාරිය රෝගය ඇතිකර සත්වයා වන්නේ ............................................ ය.



LIVEWORKSHEETS